**විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපල විවිධාංගීකරණ**
**රාජ්‍ය අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2022/2023

01. 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022/2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා අදාල ආයතනයේ ලිපි ශීර්ෂයක අයදුම්පතක්/අයදුම්පත් ලබාදෙන ලෙස ඉල්ලමින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් අයදුම්පත් ලබාගැනීමේ හැකියාව පවතින අතර,කාර්යාංශයේ නිල වෙබ් අඩවියෙන්ද (www.slbfe.lk ) මෙම අයදුම්පත් බාගත කිරීම් කළ හැක.

03. 2022.05.09 වන දින සිට 2022.05.30 දින දක්වා රාජකාරි දිනයන්හිදි පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2022.05.30 දින ප.ව 1.00 දක්වා පමණක් වේ.

04. අයිතම එකක් හෝ කිහිපයක් සඳහා ඉල්ලුම් කල හැකි අතර, ඒ සඳහා වෙන් වෙන්ව අයදුම් කිරීම සිදු කල යුතුය.

05. එම සෑම අයිතමයක් සඳහාම ආපසු නොගෙවනු ලබන රු. 1000/- ක මුදලක් (මුදලින් පමණක් ගෙවීම් කල හැක.) අයකරන අතර, ඒ සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම ශාඛා කාර්යාලයකින් විශේෂ බැංකු පිළිපත් (Bank slips) ලබා ගත හැකි අතර, චෙක්පත් භාර ගනු නොලැබේ.එම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා එම බැංකු පිළිපත් 2 (කාර්යාංශ පිටපත හා මුදල් අංශයේ පිටපත) අදාල අයදුම්පත සමග අමුණා එවීම අත්‍යාවශ්‍යය වේ. (උපලේඛනයේ සඳහන් එක් අයදුම් අංකයක් සඳහා එක් බැංකු පිළිපතක් පාවිච්චි කල යුතු අතර සේවා අයිතම කිහිපයකට අයදුම් කරන්නේ නම් අයිතම සඳහා වෙන වෙනම බැංකු පිළිපත් අදාල අයදුම්පත් සමග ඉදිරිපත් කල යුතුය.)

06. ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් හා ඉදිරිපත් කල යුතු ලිපිලේඛන පහත දැක්වේ.

5.1 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක් අනිවාර්යය වේ.(Business Registration Certificate) එසේම, මෙහි **ව්‍යාපාර ස්වභාවය** අයදුම්කරන අයිතමයට ගැලපිය යුතුය

5.2 ගරාජයන් සඳහා ලියාපදිංචි වීමේදී, ප්‍රධාන කාර්යාලය හා අදාල ශාඛා කාර්යාල පරිශ්‍රයේ සිට කිලෝමීටර 15ක දුර ප්‍රමාණයක පිහිටි ගරාජයන් විය යුතු අතර, BRC හි සඳහන් ලිපිනයෙහි ගරාජ පිහිටා තිබිය යුතුය. (කාර්යාංශය විසින් ලියාපදිංචි කිරීමට පෙර අදාල ගරාජ් ආයතන පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර, කාර්යාංශයේ ශාඛා කාර්යාල ලිපිනයන් කාර්යාංශ නිල වෙබ් අඩවියේ සඳහන් කර ඇත.)

5.3 උපලේඛනයේ සඳහන් අයිතම අංක 37 ඇතුලත් ඉදිකිරීම් කටයුතු සඳහා අයදුම්කරන්නන් විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි ලේඛණයෙන් උපුටාගත් සහතික කල ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

5.4 අදාළ බැංකු පිළිපත් වල කාර්යාංශ පිටපත හා මුදල් අංශ පිටපත (Bank slips) යන පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (කාර්යාංශ පිටපත හා මුදල් අංශ පිටපත )

07. අයිතම කිහිපයක් සඳහා අයදුම් කිරීමේදී අදාල ලිපිලේඛන හා බැංකු පිළිපත් වෙන් වෙන්ව ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.(අසම්පූර්ණ ලිපිලේඛන සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

08. සියළුම ඉල්ලුම්පත් එක් කවරයක බහා ඉදිරිපත් කළ යුතු අතර 2022.05.30 දින ප.ව 1.00 ට ප්‍රථම පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය හැකි අතර, ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2022/2023"** යනුවෙන් සඳහන් කළ යුතුය.

09. ලියාපදිංචි වන මෙම සැපයුම්කරුවන්ට අමතරව කාර්යාංශයට අවශ්‍ය භාණ්ඩ,වැඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව වෙනත් ක්‍රමවේද තෝරාගැනීමට කාර්යාංශයට හැකියාව ඇත.

10. මිල ගණන් සඳහා ලංසු ආරාධනා යොමු කල පසු ඒ සඳහා තෙවරක් (3වරක්) ප්‍රතිචාර නොදැක්වීම, අසත්‍ය තොරතුරු / ලේඛන ඉදිරිපත් කිරීම, ඉල්ලුම් කරන ලද සැපයුම් හා සේවාවන් නිසි වේලාවට සැපයීමට අපොහොසත් වීම සහ අනුමත සාම්පල් වලට අනුකූලව සැපයීම් නොකිරීම යන හේතූන් මත පූර්ව දැනුම් දීමකින් තොරව සැපයුම්කරුවන්ව සැපයුම් ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර මිල ගණන් ඉදිරිපත් කල නොහැකි නම් ඒ බව ලිඛිතව දැන්විය යුතුය.

11. හේතු දැක්වීමකින් තොරව 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති සතුය.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල

වෙබ් අඩවිය- www.slbfe.lk
දුරකතන - 0112880550 /0112887585

SLSI SYSTEM CERTIFIED ISO 9001

**එතෙර සවියට මෙතෙර අත්වැල**

# උපලේඛනය

## I කොටස

### භාණ්ඩ

1. වායුසමීකරණ යන්ත්‍ර හා අමතර කොටස්
2. පාසල් ගමන් මලු, කාර්යාලීය ගමන් මලු, අත් බෑග්, සපත්තු (කාන්තා සහ පිරිමි) සහ පිරිමි බඳ පටි
3. තිර රෙදි , බිම ඇතිරිලි කුෂන් කවර හා වෙනත් රෙදිපිළි (කාර්යාලීය)
4. ඇඟිලි සලකුණු සටහන් තැබීමේ යන්ත්‍ර
5. ස්ථාවර දුරකථන හා අමතර කොටස්
6. අකුණු සන්නායක
7. බෙහෙත් ද්‍රව්‍ය හා වෛද්‍ය උපකරණ
8. Ceramic භාණ්ඩ ,පිඟන් භාණ්ඩ, හා වීදුරු භාණ්ඩ
9. Water Dispenser හා පානීය ජල බෝතල්
10. විවිධ HARDWARE උපකරණ
11. ජංගම දුරකථන
12. කාර්යාලීය හා ගෘහාශ්‍රිත ගෘහ භාණ්ඩ (දැව, වානේ, ෆයිබර් ග්ලාස්, ප්ලාස්ටික්)
13. කාර්යාලීය උපකරණ හා උපාංග (ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, මුද්දර යන්ත්‍ර, මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර ඇතුළුව)
14. කාර්යාලීය වෙන් කිරිම් සහ අවශ්‍ය ද්‍රව්‍ය
15. රාජකාරී හැඳුනුම්පත් / ඇතුළුවීමේ අවසරපත් සකස් කිරීම
16. දින මුද්‍රා/ නිල මුද්‍රා සකස් කිරීම
17. සනීපාරක්ෂක භාණ්ඩ
18. ක්‍රීඩා භාණ්ඩ/ ක්‍රීඩා ඇඳුම්
19. කාර්ය මණ්ඩල නිල ඇඳුම්
20. ලිපිද්‍රව්‍ය
21. කුසලාන / පදක්කම්
22. ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ අමතර උපාංග (බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, වීඩියෝ කැමරා හා අමතර උපාංග, BETACAM, DV Cam, Mini DV, Cassettes, CD සහ DVD නිශ්චල කැමරා සහ අමතර උපාංග, ප්‍රදර්ශනාත්මක ඒකක සහ ප්‍රදර්ශනාත්මක කාර්යයන්)
23. අත්කම් භාණ්ඩ සහ ප්‍රවර්ධන භාණ්ඩ සැපයීම (ටී ෂර්ට්, කැප්, බෑග්, පිඟන්, කුඩ, යතුරු රඳවන (Key Tag) පෑන්, තේ ඇසුරුම් ආදිය)
24. සිල්ලර බඩු / ග්‍රොසරි ද්‍රව්‍ය (සීනි,කිරිපිටි,තේ කුඩු,කෝපි)
25. ආරක්ෂිත උපකරණ හා ද්‍රව්‍ය (උදා-මුඛ ආවරණ,මුහුණු ආවරණ,අත් වැසුම්, හිස් වැසුම්, ආරක්ෂිත ඇඳුම්)
26. විෂබීජ නාශක දියර හා ඒ ආශ්‍රිත අනෙකුත් සනීපාරක්ෂක ද්‍රව්‍යයන්

## II කොටස

### සේවාවන්

27. ප්‍රචාරක දැන්වීම් කටයුතු (බැනර් ඇඳීම, නිර්මාණාත්මක කාර්යයන් (Art Work), ප්‍රදර්ශණ පුවරු, ප්‍රදර්ශණ කුටි, සෙට් ඩිසයිනින්,Digital Printing)
28. ඇලුමිනියම් සැකසීම් (දොරවල්, ජනේල, සීවිලිම්, කාර්යාලීය කාමර වෙන් කිරීමේ සේවා සහ එම ශිල්පීය සේවාවන්)
29. ආහාරපාන සංග්‍රහ කටයුතු සේවා සැලසීම
30. පවිත්‍රතා සේවා සැපයීම
31. ආරක්ෂක සේවා සැපයීම
32. කුරියර්) සේවාව සැපයීම
33. කාර්ගෝ සේවාව සැපයීම.
34. පොත් ප්‍රකාශක ආයතන

35. ප්‍රවාහන පහසුකම් (කාර්, වෑන්, ඩබල් කැබ් රථ, බස්, ලොරි ආදිය කුලී පදනම මත සැපයීමේ සේවා)
36. උපදේශන සේවා (ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු)
37. ඉදිකිරීම් (ගොඩනැගිලි ) කොන්ත්‍රාත් ආයතන (ICTAD ආයතනයේ ලියාපදිංචි ආයතන)
38. ශිල්පීය සැපයීම් සේවා
38.1 පෙදරේරු/ පයිප්ප වැඩ
38.2 වඩු වැඩ / දැව පොලිෂ්කරුවන්
38.3 වෙල්ඩින්කරුවන්, ලියවන පට්ටල් සේවා/ යකඩ පෑස්සුම්
38.4 ගොඩනැගිලි පින්තාරු කිරීම/ සුළු අලුත්වැඩියා කටයුතුවිදුලි පරිපථ,
38.5 යාන්ත්‍රික උපකරණ හා සම්බන්ධ සේවාවන්/ විදුලි හා ජල මෝටර් එතීම.
39. මළ අපවහන පද්ධති ඉදිකිරීම හා අප ජලය බැහැර කිරීම ආශ්‍රිත සේවා සැපයීම
40. කාර්යාලීය පුටු කුෂන් කිරීම හා කාර්යාලීය ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව
41. රේගු සේවා සැපයීම්
42. උත්සව කටයුතු සඳහා නර්තන කණ්ඩායම් සැපයීම
43. ගලි පවිත්‍ර කිරීමේ සේවා/මළ අපවහන සේවා සහ සනිපාරක්ෂක බහාලුම් සේවා
44. විදුලි හා වායු සමීකරණ කටයුතු සම්බන්ධ සේවා
45. විගණන කටයුතු සහ වෘත්තීමය උපදේශන සේවා සැපයීම
46. ගෙවතු අලංකරණය/ ගෘහස්ථ මල් පැළෑටි සැපයීමේ සේවා
47. කේබල් රූපවාහිනී සහ චන්ද්‍රිකා රූපවාහිනී පහසුකම්
48. කෘමීන්/ මදුරුවන් හා මීයන් මර්ධන සේවා
49. වීඩියෝ කිරීම, ඡායාරූප ගැනීම, සේයා පටල සේදීම හා මුද්‍රණය, ඡායාරූප රාමු කිරීම, ලැමිනේටින් කිරීමේ සේවා, ඇල්බම් සකස් කිරීම, Box Mount කිරීම
50. විදුලි සෝපාන අළුත්වැඩියා කිරීමේ සේවා
51. කාර්ය මණ්ඩල පුහුණු කිරීම (තොරතුරු තාක්ෂණ, පරිපාලන හා මානව සම්පත්, මුදල්, තාක්ෂණික, නීති, ප්‍රසම්පාදන, විගණන, භාෂා ආදී)
52. දුරකථන පද්ධති සහ මහජන ඇමතුම් සේවා
53. කම්කරු සැපයුම් සේවා
54. හෝටල් සහ රෙස්ටුරන්ට් (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය හෝ නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහිත)
55. රක්ෂණ සමාගම් (කාර්යාලීය නිලධාරීන්, විගමනික ශ්‍රමිකයින්, වාහන, ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ, විදේශ සංචාර ආදී)

## III කොටස

## වාහන අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියාව හා නඩත්තුව

56. වාහන සඳහා Audio Players, Video Players සහ Reverse Camera සැපයීම හා සවිකිරීම
57. වාහන සඳහා අමතර කොටස්
58. වාහන සඳහා වායු සමීකරණ කටයුතු
59. වාහන විදුලි පරිපථ පද්ධතියේ අළුත්වැඩියාව හා සම්බන්ධ සේවා
60. වාහන වාර සේවා කටයුතු (වාහන අභ්‍යන්තර / බාහිර සේදීමේ කටයුතු ඇතුළුව)
61. වාහන අළුත්වැඩියාව (ටින්කර් කිරීම, පේන්ට් කිරීම හා යාන්ත්‍රික අළුත්වැඩියාව)
62. ත්‍රීවීල්, යතුරුපැදි සම්බන්ධ සියලුම අලුත්වැඩියා කටයුතු
63. ත්‍රීවීල්, යතුරුපැදි සම්බන්ධ වාර සේවා කටයුතු
64. වාහන කුෂන් කිරීමේ සේවා
65. වීල් බැලන්ස් කිරීම හා වීල් එලයිමන්ට් කිරීමේ සේවා
66. වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි

## IV කොටස

## තොරතුරු තාක්ෂණය සම්බන්ධ උපාංග මිලදී ගැනීම, සේවා සැපයීම සහ විදුලි උපකරණ

67. මෘදුකාංග පැකේජ (System Software and Application Software) මිලදී ගැනීම සහ අදාල සේවා සැපයීම

68. පරිගණක යන්ත්‍ර, Laptop පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ආශ්‍රිත සියළුම උපාංග, දෘඩාංග, ගුවන් ගමන් බලපත්‍ර කියවන යන්ත්‍ර (Passport Scanners), කාර්යාංශ ආරක්ෂිත මුද්දර කියවන (Bar code readers) යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග මිලදී ගැනිම,නඩත්තු කිරීම, අලුත්වැඩියා සහ සේවා සැපයීම.
69. Toners, Cartridges, Ribbons, Ink (පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් සහ රෝනියෝ යන්ත්‍ර සඳහා)
70. UPS යන්ත්‍ර මිල දී ගැනිම, බැටරි මිල දී ගැනිම, UPS පද්ධති සහ සේවා ලබා ගැනිම, UPS යන්ත්‍ර අළුත්වැඩියාව සහ අමතර කොටස් මිලදී ගැනිම
71. ප්‍රධාන පරිගණක (Server) මිලදී ගැනිම, අළුත්වැඩියා කිරිම Server ආශ්‍රිත සේවා සැපයිම සහ අමතර උපාංග මිලදී ගැනිම, අදාල උපදේශන සේවා ලබා ගැනිම සහ ප්‍රධාන පරිගණක ආශ්‍රිත මෘදුකාංග මිලදී ගැනිම
72. ඩොන්ගල් (Dongle) හා රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා (Router) මිලදී ගැනිම
73. පරිගණක ජාලකරණය ආශ්‍රිත සේවා සහ පරිගණක ජාල ගත කිරීමේ උපාංග සැපයිම (දුරකථන කළමණාකරණ පද්ධති (PABX) ජාලකරණ කටයුතු, IP/VPN, රවුටර්, ස්විච්, පරිගණක සර්වර් පරිශ්‍ර ආශ්‍රිත සේවා, සර්වර් පරිශ්‍ර ආශ්‍රිත බිම (Floor) සැකසීම්, පරිගණක ජාලකරණ රැහැන් රහිත සහ රැහැන් සහිත සේවා සැපයීම්
74. තොරතුරු තාක්ෂණ උපදේශණ සේවා සැපයීම
75. මෘදුකාංග බලපත්‍ර හා ආරක්ෂක සහතික (SSL Certificate) මිලදී ගැනීම.
76. පරිගණක මෘදුකාංග නිර්මාණය කිරීම, ස්ථාපිත කිරිම හා ඊට අදාළ සේවා සැපයීම
77. CCTV පද්ධති මිලදි ගැනිම, නඩත්තු කිරිම හා ඒ ආශ්‍රිත සේවා සැපයිම

## V කොටස
## විදුලි උපකරණ සැපයීම් හා ඒ ආශ්‍රිත සේවා

78. විදුලි උපකරණ (විදුලි පංකා, රූපවාහිනී යන්ත්‍ර, DVD යන්ත්‍ර සහ ගෘහමය මුළුතැන්ගෙයි උපකරණ ඇතුළුව)
79. විදුලි උපාංග හා අමතර කොටස්
80. විදුලි සෝපාන සහ අමතර කොටස්
81. විදුලි උත්පාදක යන්ත්‍ර කුලියට ගැනීම සහ මිලදි ගැනිම, අළුත්වැඩියාව සහ සේවා සැපයිම
82. විදුලි/ යාන්ත්‍රික /සිවිල් උපදේශන සේවා සහ ශිල්පීය (Technical) සැපයුම් සේවා සැපයිම

## V1 කොටස
## අනෙකුත් සේවා

83. උත්සව සඳහා අවස්ථා කළමනාකරණ කටයුතු
84. උත්සව කටයුතු සඳහා ආලෝකකරණය/ අලංකරණ කටයුතු/ශබ්ද විකාශන කටයුතු
85. කාර්යාලිය අලංකරණ කටයුතු
86. මාධ්‍ය උපාංග සහ සංස්කරණ කටයුතු
87. මුද්‍රණ කටයුතු (ඕෆ්සෙට් ලෙටර් ප්‍රෙස්, ඩිජිටල්, රෙදි පින්තාරු සහ ලිපි ගොනු කවර මුද්‍රණය කිරීම, දිනපොත් හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම - සඟරා, පුවත්පත්, රිසිට් පොත්)
88. සංයුක්ත තැටි කොපි කිරිම
89. යතුරු ලියන අලුත් වැඩියා කිරිම
90. භාෂා පරිවර්තන කටයුතු (සිංහල, ඉංග්‍රීසි, දෙමළ, අරාබි, කොරියානු, ජපන් සහ ඉතාලි)
91. උත්සව කටයුතු සඳහා භාණ්ඩ සැපයීම (තාවකාලික කුටි (Huts, Tents) මේස, පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර, බුමුතුරුණු, අලෝකකරණ, Podium (පෝඩියම්), කොඩි කණු ආදිය)
92. රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය, රූපවාහිනී දැන්වීම් සැකසීම, මාධ්‍ය ප්‍රචාරක කටයුතු, වීඩියෝ නිෂ්පාදනය, වීඩියෝ පට සංස්කරණය හා පටිගත කිරිම, වාර්තාමය චිත්‍රපටි සහ ටෙලි නාට්‍ය නිෂ්පාදනය කිරීම
93. අබලි ද්‍රව්‍ය මිලදි ගැනිම (පරිගණක හා ආශ්‍රිත, කඩදාසි/කාර්යාලීය අබලි ද්‍රව්‍ය ඇතුළුව)
94. ගුවන් සමාගම්/ ගුවන් ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිත ආයතන
95. පෙර සැකසුම් ගොඩනැගිලි
96. බහාලුම් සපයන්නන් (කන්ටේනර් ආදිය)
97. සූර්ය විදුලි කෝෂ සවි කිරීම, අමතර කොටස් සැපයීම හා සේවා සැපයීම.

ආදර්ශ අයදුම් පත්‍රය (එක් එක් භාණ්ඩ හා සේවා සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය .)

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2022/2023

1. අයදුම්කරුගේ / ආයතනයේ නම : .......................................................................................
(ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

2. අයදුම්කරුගේ/ ආයතනයේ ලිපිනය : .......................................................................................
(ලබාදී ඇති ලිපිනයන්,ව්‍යාපාර සහතික පසුව වෙනස් වූයේ නම් ඒ බව ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ප්‍රසම්පාදන අංශය වෙත දැනුම් දීමට කටයුතු කල යුතුය.)

3. සැපයීම්/ සේවා ස්වභාවය : .......................................................................................
අයිතම අංකය : ....................... අනු අයිතම අංකය : ...........................................
(අදාළ සේවාව හා අයිතම අංකය පැහැදිළිව සඳහන් කරන්න)

4. දුරකථන, ෆැක්ස් සහ විද්‍යුත් ලිපිනය
දුරකථනය : .......................................................................................
ෆැක්ස් : .......................................................................................
විද්‍යුත් ලිපිනය : .......................................................................................

5. විමසීම් කළ යුතු අයගේ නම, තනතුර හා ජංගම දූරකතන අංකය
නම : .......................................................................................
තනතුර : .......................................................................................
ජංගම දුරකථන අංකය : .......................................................................................

6. ගණුදෙනු කරන ලද බැංකුකරුවන්ගේ නම් : .......................................................................................

7. ප්‍රධාන ව්‍යාපාරික කාර්යය හා ව්‍යාපාර ස්වභාවය (සමාගමක්ද, තනි ව්‍යාපාරයක්ද යනාදි වශයෙන්) :
.......................................................................................

8. දැනට ව්‍යාපාරික කටයුතු ඉටු කරනු ලබන රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන (විමසීම් කටයුතු සඳහා එම ආයතන වල දුරකථන අංක ඉදිරිපත් කළ යුතුය) :
.......................................................................................

9. මිලදී ගැනීමේ ක්‍රියාවලිය අවශ්‍ය අවස්ථාවන්හිදී ලංසු බැඳුම්කරය/ කාර්ය සාධන බැඳුම්කර ඉදිරිපත් කිරීමට එකඟද යන වග:
ඔව්/ නැත : .......................................................................................

10. ලබාදීමට හැකි ණය පහසුකම් (කාලසීමාව/ ප්‍රමාණය) : .......................................................................................
(ණය පදනම යටතේ භාණ්ඩ ලබාදිය හැකි කාල සීමාව දැක්වීම අත්‍යාවශ්‍යය වන අතර අවශ්‍ය අවස්ථාවලදී ලංසු සුරක්ෂණ (bid Security) හා කාර්යය සාධන බැදුම්කර (performance bond)ඉදිරිපත් කිරීමට එකග විය යුතුය.)

11. එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංකය (තිබේ නම්) .......................................................................................

12. ලියාපදිංචි ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර - මුදල් කුවිතාන්සි අංකය: ...........................................(කාර්යාංශ පිටපත හා මුදල් අංශ පිටපත ඉදිරිපත් කළ යුතුය.

මම/ අපි විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා දෙන ලද පිරිවිතරයන්ට අනුව භාණ්ඩ/ සේවා ලබා දීමටද, එම මිල ගණන් ශ්‍රී ලංකා වලංගු රුපියල් වලින් මිල ගණන් ඉදිරිපත් කරන බවද මෙයින් එකඟ වෙමි/ වෙමු. එසේම, භාණ්ඩ/ සේවා පිරිවිතරයන්ට අනුව සැපයීමට මම/ අපි අපොහොසත් වුවහොත් 2022/2023 වර්ෂයේ කාර්යාංශයේ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් අප ආයතනය අසාදුගත කිරීමට ලක්වන බවද අවබෝධ කර ගනිමි/ ගනිමු.

අත්සන : .......................................................................................

තනතුර : .......................................................................................

රබර් මුද්‍රාව : .......................................................................................

දිනය : .......................................................................................